# බප/ජය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
## පළමු වාර පරීක්ෂණය - 2012
## බුද්ධාගම - I කොටස

11 ශ්‍රේණිය ........ ලං. 40

නම / විභාග අංකයඃ ............................................................ කාලය : පැය ½ යි.

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

* නිවැරදි පිළිතුර තෝරන්න.

(01) යම් තැනැත්තකු බෞද්ධයකු බවට පත්වීමේ පළමු පියවර වන්නේ,
(i) වත්පිළිවෙත් කිරීමය. (ii) තෙරුවන් සරණ යෑමය.
(iii) පන්සිල් සමාදන් වීමය. (iv) සිල්වතුන්ට දන් පැන් පිදීමය.

(02) භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීම පරිදි බුද්ධශාසනය ආරක්ෂා කිරීම සඳහාම රාජ්‍යට පත්වූ පාලකයා,
(i) දුටුගැමුණු රජතුමා (ii) මහා විජයබාහු රජතුමා
(iii) මහා පරාක්‍රමබාහු රජතුමා (iv) නිශ්ශංකමල්ල රජතුමා

(03) "ඵුට්ඨස්සලෝක ධම්මෙහි - චිත්තං යස්සනකම්පති" මෙහි අදහස වන්නේ,
(i) ලෝකය වටකුරු බවය (ii) සිත දමනය වන බවය
(iii) කම්පාවෙන් සිටිය යුතු බවය (iv) අටලෝ දහමින් කම්පා නොවීමය

(04) මිහිඳු මාහිමියන් පැමිණි පසු අනුරපුර කරවන ලද ප්‍රථම දාගැබ වන්නේ
(i) ථූපාරාමය දාගැබ (ii) රුවන්වැලි දාගැබ
(iii) ජේතවන දාගැබ (iv) මිරිසවැටිය දාගැබ

(05) චතුර් වර්ණයට මින් අයත් නොවන්නේ,
(i) ක්ෂත්‍රිය (ii) බ්‍රාහ්මණ
(iii) වෛශ්‍ය (iv) උපනිෂද්

(06) බුදුන් දවස සමකාලීනයෙක් නොවන්නේ,
(i) සෝණදණ්ඩ (ii) ච..කි බ්‍රාහ්මණයා
(iii) සකුළුදායි (iv) ජවහර්ලාල් නේරු තුමා

(07) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර
(i) සතර කර්මස්ථාන වේ. (ii) සතර කමටහන් වේ.
(iii) සතර බ්‍රහ්ම විහරණ වේ. (iv) සතර අගති වේ.

(08) පානදුරාවාදය සඳහා වාදීභසිංහ යන නාමය භාවිතා කළේ,
(i) අනගාරික ධර්මපාල (ii) හික්කඩුවේ ශ්‍රී සුමංගල
(iii) වැලිවිට සරණංකර හිමි (iv) මිගෙට්ටු වත්තේ ගුණානන්ද හිමි

(09) පළවන ධර්ම සංගායනාවේ මූලිකත්වය ගත්තේ
(i) මහාකාශ්‍යප හිමි (ii) සබ්බකාමි හිමි
(iii) ආනන්ද හිමි (iv) උපාලි හිමි

(10) පන්සිය පනස් ජාතක පොත ලියන ලද්දේ
(i) ගම්පොළ යුගයේදීය. (ii) අනුරාධපුර යුගයේදීය.
(iii) කුරුණෑගල යුගයේදීය. (iv) දඹදෙනි යුගයේදීය.

(11) බුදුරජාණන් වහන්සේගේ චරිතයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ අවවාදය හා ආදර්ශයයි. එම ගුණාංගය
(i) තාදි ගුණය ලෙස හැඳින්වේ.
(ii) පුරිස ධම්ම සාරථී ගුණයයි.
(iii) යථාවාදී තථාකාරී - යථාකාරී තථාවාදී ගුණයයි
(iv) සත්ථා දේවමනුස්සානං ගුණයයි.

(12) සබ්බේ සංඛාරා අනිච්චාති යන ධම්මපද ගාථාවලට අනුව බුදුදහමේ ඉගැන්වෙන ධර්මතාව වන්නේ,
(i) ත්‍රිවිද්‍යාවය (ii) ත්‍රිවිධ චෛත්‍යයයි
(iii) ත්‍රිලක්ෂණයයි (iv) ත්‍රිහේතුකයයි

(13) කුසලා කුසල ක්‍රියාවන් සිදු කෙරෙන ද්වාරත්‍රය නම්
(i) ලෝභ දෝස මෝහ (ii) සිත කය වචනය
(iii) ශීල සමාධි ප්‍රඥා (iv) දාන ශීල භාවනා

(14) නිහතමානි ගුණය යනු
(i) සක්කෝ ගුණය (ii) අනතිමානි ගුණයයි
(iii) ඍජු ගුණයයි (iv) සුසාර ගුණයයි

(15) දෙමාපියන් බ්‍රහ්ම නමින් හඳුන්වන්නේ,
(i) හදවතින්ම කුලුණු සිත් ඇති නිසාය (ii) මුදිතා ගුණයෙන් යුතු නිසාය
(iii) සිව්බඹ විහරණයෙන් යුතු නිසාය (iv) මේ සියල්ලම නිසාය

(16) ස්වර්ණමාලි මහා ස්තූපය
(i) ධාන්‍යාකාරය (ii) ඝණ්ටාකාරය
(iii) පද්මාකාරය (iv) බුබ්බුලාකාරය.

(17) මහාතිස්ස නම් වූ භික්ෂුන්වහන්සේට පෞද්ගලික පූජාවක් වශයෙන් අභයගිරි විහාරය පූජා කළේ
(i) වළගම්බා රජ තුමාය (ii) දුටුගැමුණු රජතුමාය
(iii) මහාපරාක්‍රමබාහු රජතුමා (iv) මහාවිජබාහු රජතුමා

(18) සිත් පහන් වීම සඳහා විවිධ ශාරීරික හා මානසික ආබාධවලින් සහනය ලැබීම සඳහාත් බටහිර උගතුන්ගේ විශේෂ අවධානය යොමුවී ඇත්තේ,
(i) බෞද්ධ වත් පිළිවෙත් කෙරෙහිය (ii) යාගහෝම කෙරෙහිය
(iii) බෞද්ධ භාවනා කෙරෙහිය (iv) බෞද්ධ සාරධර්ම කෙරෙහිය

(19) දෙවෙනි ධර්ම සංගායනාවේ මූලිකත්වය දැරුවේ
(i) සබ්බකාමී රහතන් වහන්සේ (ii) මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ
(iii) උපාලි රහතන් වහන්සේ (iv) නන්ද තෙරුන් වහන්සේ

(20) ධම්මපද ගාථා පොතෙහි ගාථා
(i) 402 කි (ii) 423 කි (iii) 438 කි (iv) 422 කි

## බප/ජය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
## පළමු වාර පරීක්ෂණය - 2012
### බුද්ධාගම - II කොටස

ලං. 60

11 ශ්‍රේණිය .........

නම / විභාග අංකය: ............................................................................ කාලය : පැය $\frac{1}{2}$ යි.

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) 11 ශ්‍රේණියේ බුද්ධ ධර්මය විෂය ඇසුරු කොට ගෙන බුදුරජාණන් වහන්සේ පිළිබඳ සමකාලීනයන්ගේ අදහස් හා උන්වහන්සේගේ ගුණ පිළිබඳ ප්‍රශ්න විචාරාත්මකව ලබාගත් පිළිතුරු හා තොරතුරු.

(i) බුදුරජාණන් වහන්සේගේ ගුණ අගය කළ සමකාලීනයන් දෙදෙනෙක් නම් කරන්න.

(ii) මෑත කාලයේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය අගය කළ විද්වතුන් දෙදෙනෙක් නම් කරන්න.

(iii) බුදුරජාණන් වහන්සේ අගය කළ බමුණු පඬිවරුන් විසින් උන්වහන්සේ හමුවීම සුදුසු බවට කළ ඇගයීම සඳහා ඔවුන් විසින් හේතු ලෙස දක්වූ බුද්ධ චරිතයේ ලක්ෂණ 02 ක් නම් කරන්න.

(iv) ලෝවැසියාගේ හිත සුව පිණිස තම කාලය උපරිම වශයෙන් කොටස් කීයකට බෙදා වෙන්කර තිබුණේද?

(v) බුදුරජාණන් වහන්සේ අටලෝ දහමින් කම්පා නොවූ සේක. උන් වහන්සේ එම ගුණය කවර නමකින් හැඳින්වේද?

(vi) බුදුරජාණන් වහන්සේ කෙලෙහි ගුණ දැක්වීමේ අගය ලොවට ප්‍රකාශ කළ අවස්ථා දෙකක් නම් කරන්න.

(vii) සිදුහත් කුමරුගේ ශිෂ්‍ය ජීවිතයෙන් ඔබගේ ජීවිතයේ අභිවෘද්ධියට ගත හැකි ආදර්ශ දෙකක් නම් කරන්න.

(viii) බුදුරජාණන් වහන්සේ සියලු සත්වයන්ටම මහා කාරුණික වූහ. උන් වහන්සේගේ කරුණා මහිමයෙන් සැනසීම ලඟා කරගත් දෙදෙනෙක්ගේ නම් ලියන්න.

(ix) "ආසියාවේ ආලෝකය නැමති ග්‍රන්ථයෙන්" බුදුන් වහන්සේ අගය කළ පඬිවරයා කව්ද?

(x) ඔබගේ ශිෂ්‍ය ජීවිතයට සම්බන්ධ කරගත හැකි බුදු සිරිතෙන් ගත හැකි ආදර්ශ 02 ක් දක්වන්න.

(02) (i) භාවනාවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(ii) නිවන් මග අවුරන පංච නීවරණ නම් කර ඉන් එකක් විස්තර කරන්න.

(iii) එදිනෙදා ලෞකික ජීවිතයේ අභිවෘද්ධිය සඳහා භාවනාවෙන් ලැබෙන ප්‍රතිඵල කෙටියෙන් පැහැදිලි කරන්න.

(03) (i) බුදුරජාණන් වහන්සේ අගය කළ පද්මාකාර ජීවිතය යනු කුමක්ද?

(ii) පද්මාකාර ජීවිතයක් ගත කිරීමට ඔබ තුළ ඇතිකර ගත යුතු ගුණාංග කීපයක් විස්තර කරන්න.

(iii) අටලෝ දහමින් මුහුණ දෙමින් සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා පද්මාකාර ජීවිතය ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.

(04) (i) ''කර්මය'' යන්න හඳුන්වා ඇති පාලි පාඨය ලියන්න.

(ii) පුනර්භවය සිදුවන්නේ (නැවත නැවත උපදින්නේ) කුමන හේතු නිසාද?

(05) (i) මහින්දාගමනයෙන් පසු ඒ ආසන්නයේම ඉදිකළ පූජනීය ස්ථාන තුනක් නම් කරන්න.

(ii) ශ්‍රී මහා බෝධීන් වහන්සේ ගැන කෙටි හැඳින්වීමක් කරන්න.

(iii) ඔබ ශිෂ්‍යයෙක් හැටියට භාවනා කිරීමෙන් ලද ප්‍රතිඵල පිළිබඳ සිහිගන්වමින් තව කෙනෙකුට පැහැදිලි කරන ආකාරය පහදන්න.

(06) (i) බුද්ධකාරක (පාරමිතා) ධර්ම අතුරෙන් තුනක් නම් කරන්න.

(ii) ඉන් එකක් පැහැදිලි කරන්න.

(iii) පාරමිතාවලින් ශිෂ්‍ය ජීවිතයට ආදර්ශ පැහැදිලි කරන්න.

(07) අසවලා මට බැන්නේය. පහර දුන්නේය යයි සිතා නැවත නැවත ක්‍රෝධ කරමින් ආරවුල්වලට යොමුවේ.

(i) මේ බව දැක්වීමට බුදු හිමි වදාළ ධම්මපද ගාථාව ලියන්න.

(ii) එම ගාථාවේ සිංහල අරුත පැහැදිලි කරන්න.

(iii) සමාජයේ ක්‍රෝධය ඇතිවීමට හා පැවතීමට හේතුවන කරුණු පැහැදිලි කර එසේ නොවීමට ක්‍රියා කළ යුතු ආකාරය කෙටියෙන් දක්වන්න.

(08) පහත දක්වෙන එක් කොටසකින් එක් මාතෘකාවක් බැගින් තෝරාගෙන මාතෘකා තුනකට කෙටි සටහන් ලියන්න.

| 1 කොටස | 2 කොටස | 3 කොටස |
|---|---|---|
| ධර්ම භාණ්ඩාගාරික | අටලෝදහම | මහමෙව්නාව |
| රාහුල මාතා | ත්‍රි ශික්ෂාව | රුවන්වැලිසැය |
| මහසෙන් රජතුමා | සම්මා වාචා | මිහින්තලය |
| මහාපරාක්‍රමබාහු | සතර සංග්‍රහ වස්තු | සීගිරිය |